**ශීර්ෂය 307 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 307 - මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 03 දින මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,602.00 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 3,407.35 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 194.65 ක් හෙවත් සියයට 5.40 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 2,361.01 | 2,217.65 | 143.36 | 6.07 |
| මුලධන | 1,240.99 | 1,189.70 | 51.29 | 4.13 |
| **එකතුව** | **3,602.00** | **3,407.35** | **194.65** | **5.40** |

## 2.2 ආදායම් ගිණුම

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේත 04 ක් සඳහා එකතුව රු.මිලියන 11,360 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 11,934.58 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 105 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20.03.02.14 | 9,000.00 | 9,345.57 | 345.57 | 3.84 |
| 20.03.07.04 | 60.00 | 63.56 | 3.56 | 5.93 |
| 10.03.01.00 | 1,300.00 | 1,306.50 | 6.50 | 0.50 |
| 20.03.02.15 | 1,000.00 | 1,218.95 | 218.95 | 21.90 |
| **එකතුව** | **11,360.00** | **11,934.58** | **574.58** | **5.06** |

## 2.3 අත්තිකාරම් ගිණුම

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

#### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 30701 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 35.29 | 26.79 | 20.00 | 32.36 | 135.00 | 93.98 |

## 2.4 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අග්‍රිම ගිණුම් දෙකක 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.මිලියන 121.25 ක් විය. විස්තර පහතින් දැක්වේ.

| අග්‍රිම ගිණුම් අංක | 2015 දෙසැම්බර් 31දිනට ශේෂය |
| --- | --- |
| | රු.මිලියන |
| 7002/0000/00/0075/0015/000 | 67.67 |
| 7002/0000/00/0075/0097/000 | 53.58 |
| **එකතුව** | **121.25** |

## 2.5 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 07 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 499.28 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- |
| | රු. මිලියන |
| 6000/0000/00/0015/0161/000 | 2.00 |
| 6000/0000/00/0002/0053/000 | 0.22 |
| 6000/0000/00/0013/0027/000 | 3.45 |
| 6000/0000/00/0014/0004/000 | 409.35 |
| 6000/0000/00/0016/0010/000 | 18.03 |
| 6000/0000/00/0018/0012/000 | 66.04 |
| 6000/0000/00/0003/0159/000 | 0.19 |
| එකතුව | 499.28 |

## 2.6 විගණන නිරීක්ෂණය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන මෙහි 1.1 ඡේදයේ දක්වා ඇති කළමණාකරන විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමණාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන දෙකක් පවත්වා නොතිබුණු අතර, තවත් ලේඛනයක් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (i) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසිය 891(1) | පවත්වා නොතිබුණි |
| (ii) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසිය 341 | - එම - |
| (iii) | වැය ලෙජරය | මුදල් රෙගුලාසිය 447 | යාවත්කාලීන කර නොතිබුණි |

### 3.2 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉතාමත් අඩු රේගු බදු මුදලක් ගෙවා විශේෂ කාර්යයන් වෙනුවෙන් ආනයනය කර තිබූ වාහන 21 ක් ද්විත්ව කාර්යය වාහන ලෙස ලියාපදිංචි කර තිබුණි. එසේ ආනයනය කරන ලද වාහන අදාළ කාර්ය සඳහාම යොදවා තිබුණු බව සනාථ කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් පසුවිපරම් කර නොතිබුණි. එම වාහන භෞතිකව පරීක්ෂා කිරීමට හැකි වන පරිදි විගණනයට ඉදිරිපත් කරන බව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් ප්‍රකාශ කර තිබුණත්, 2015 දෙසැම්බර් 31 දින වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේදී ලියාපදිංචි කර තිබුණු යතුරුපැදි 345 කට සහ මෝටර් වාහනයකට අදාළ ලිපිගොනු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.3 විසර්ජන ගිණුම

#### 3.3.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයක් සඳහා සලසා තිබුණු රු. මිලියන 117.09 ක ප්‍රතිපාදනය මුළුමණින්ම ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 47 ක සිට සියයට 57 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.4 අග්‍රිම ගිණුම**

--------------

දෙපාර්තමේන්තුවේ අග්‍රිම ගිණුමේ වු 1997 වර්ෂයේ සිට පැවැත එන රු. 53,575,400 ක අග්‍රිම ශේෂය 2016 අප්‍රේල් 30 දින වන විටත් පියවා නොතිබුණි.

**3.5 පොදු තැන්පත් ගිණුම**

------------------------

වර්ෂ 02ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.1,536,011 ක් වූ තැන්පතු 57 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.6 ආදායම් ගිණුම්**

-----------------

දෙපාර්තමේන්තු ප්‍රධානියාට ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් ආදායම් සංකේත 04 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරිමේ කාර්යභාරයන් පැවරී තිබුණි. එම ආදායම් සංකේතවලට අදාළව සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) 20-03-02-15 දරන ආදායම් සංකේතය - මෝටර් වාහන පැවරීමේදී වාහන ආනයන බලපත්‍ර යටතේ අයකරනු ලබන ගාස්තු**

------------------------------------------------------------------------------------------

සහනදායී බලපත්‍ර යටතේ ආනයනය කරන වාහන වර්ෂ 05 ක් ඉක්මවීමට ප්‍රථම වෙනත් පාර්ශවයකට පැවරීමේදී එම වාහනවල මි.රැ.ග. වටිනාකම මත සියයට 10 ක අතිරේක ගාස්තුවක් 2014 මාර්තු 26 දින සිට අයකළ යුතු බව 2014 මාර්තු 25 දිනැති අංක TTIP/PIM/04/03/9-1 දරන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛය මගින් පෙන්වාදී තිබුණි. එහෙත් ඒ සඳහා නිශ්චිත ආදායම් සංකේතයක් හඳුන්වා දී නොතිබීම හේතුවෙන් 2014 වර්ෂයේදී එසේ රැස්කර ගෙන තිබුණු රු.මිලියන 1,003 ක ආදායමක් අංක 20.03.02.14 දරන ආදායම් සංකේතය යටතේ ගිණුම්ගත කර තිබුණු අතර 2015 වර්ෂයේදී එමගින් රැස්කර ගෙන තිබුණු රු.මිලියන 1,218 ක ආදායම අංක 20.03.02.15 දරන නව ආදායම් සංකේතය යටතේ ගිණුම්ගත කර තිබුණි. එසේ වුවද මෙම ගාස්තු අය කිරීම සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත් බවට සාක්ෂියක් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ)10-03-01-00 දරන ආදායම් සංකේතය - සුඛෝපභෝගී මෝටර් වාහන බදු ආදායම්**

--------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් 1995 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා විධිමත් ලෙස ආදායම් ලේඛන පවත්වා නොතිබුණු බැවින් ඉකුත් වර්ෂවල මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද අයවිය යුතු හිඟ ආදායම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 128(2)(ඇ) ප්‍රකාරව සහ 2002 ජුලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛයේ 08 වන ඡේදය ප්‍රකාරව, ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද දෙපාර්තමේන්තුව විසින් හිඟ ආදායම් පිළිබඳ අර්ධ වාර්ෂික වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(iii) 2002 ජූලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව ආදායම් පිළිබඳ කාර්යසාධන වාර්තා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) 10-03-07-04 දරන ආදායම් සංකේතය - මෝටර් වාහන විකිණීම මත බදු ආදායම්**

2002 ජූලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව ආදායම් පිළිබඳ කාර්යසාධන වාර්තා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ඈ) 20-03-02-14 දරන ආදායම් සංකේතය - මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අය කරනු ලබන ගාස්තු හා අනෙකුත් ලැබීම්**

2002 ජූලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ චක්‍රලේඛයේ 07 ඡේදය ප්‍රකාරව ආදායම් පිළිබඳ කාර්යසාධන වාර්තා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 3.7 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 30701 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිටි තිබුණු ශේෂවල එකතුව රු.4,882,356 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 27 දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අය කර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් ණය ගෙවීමේදී පිළිපැදිය යුතු විධිවිධාන අනුගමනය නොකර රු. 2,775,281 ණය ගෙවා තිබුණි.

## 3.8 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.8.1 විගණන හා කළමනාකරණ කමිටුව

2009 ජූනි 09 දිනැති අංක DMA/2009(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාර සෑම විගණන හා කළමනාකරණ කමිටුවක්ම අවම වශයෙන් කාර්තුවකට එක් වරක් හෝ රැස්විය යුතුව තිබුණත්, දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේ දී විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 3.9 අනුකූල නොවීම්

-------------------

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**----------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදය 29 වගන්තිය | විගණන විමසුම්වලින් පෙන්වා දී ඇති නිරීක්ෂණවලට අදාළව වංචනිකව කටයුතු කිරීමට සම්බන්ධ නිලධාරීන්ට විරුද්ධව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 155 | විගණන විමසුමෙන් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 156(5) | ලියාපදිංචි කරන ලද යතුරු පැදිවලට අදාළ ලිපිගොනු අවිධිමත්ව හා අනාරක්ෂිතව පවත්වා තිබුණි. |

## 3.10 කාර්යසාධනය

----------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

-----------------------------------------------------

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ඉටු නොකර/ ප්‍රමාණවත් ලෙස ඉටු නොකර තිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ එක් අරමුණක් වනුයේ මෝටර් රථ වාහන පනතට අදාළ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කිරීමයි. මේ සඳහා පවත්නා පරිගණක පද්ධතියේ දුර්වලතා මඟ හරවා ගනිමින් විශාල වශයෙන් සිදු වන වැරදි, වංචා හා අක්‍රමිකතා වැළැක්වීමට/ අනාවරණය කර ගැනිමට හැකි වන පරිදී තාක්ෂණය යොදා ගැනීම සඳහා ඊ-මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වාර්ෂිකව සලසා තිබුණි. 2015 වර්ෂයේදී ඒ සඳහා රු.මිලියන 250 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණු අතර 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.මිලියන 740 ක ප්‍රතිපාදන සලසාගෙන තිබුණි. අදාළ ප්‍රතිපාදන උපයෝගී කරගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් දෙපාර්තමේන්තුව විසින් ගෙන නොතිබුණි. එසේම සලසා තිබුණු

ප්‍රතිපාදන නිරන්තරයෙන්ම වෙනත් වැය විෂයයන්වලට මාරු කර ඒවායේ කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි.

(ii) මෝටර් වාහන සඳහා අයකරන ගාස්තු සංශෝධනය කරමින් 2011 සැප්තැම්බර් 09 දින නිකුත් කර තිබුණු අංක 1722/27 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් 2012 ජුනි 15 දිනැති අංක 14 දරන අභ්‍යන්තර චක්‍රලේඛය නිකුත් කර තිබුණි. එහෙත් වාහන පැවරීම සම්බන්ධයෙන් අදාල චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iii) වාහන හිමිකම් හුවමාරුවේදී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන MTA-6 පිටපතේ සඳහන් පැවරුම්ලාභියාට පරිබාහිර වූ වෙනත් අයෙකුට වාහන හිමිකම හුවමාරු කර තිබුණු අවස්ථා අනාවරණය වී තිබුණත්, ඒවා නිවැරදි කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ආ) සැලැසුම් කිරීම.

------------------

මෝටර් රථ ප්‍රවාහන පනත ක්‍රියාත්මක කිරීම සඳහා භෞතික සම්පත් ප්‍රශස්ථ ලෙස යොදා ගැනීම දෙපාර්තමේන්තුවේ එක් අරමුණක් වුවද, දෙපාර්තමේන්තුව විසින් ලියාපදංචිය හා පැවරුම් කරන වාහනවලට අදාළව විවෘත කරන ලිපිගොනු ක්‍රමවත්ව හා සුරක්ෂිතව තබා ගැනීම සඳහා අවශ්‍ය ගබඩා පුළුල් කිරීමේ අවශ්‍යතාව හඳුනාගෙන ඒ සඳහා අවශ්‍ය සැලැසුම් 2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

**3.11 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**------------------------------------**

**ගැලපුම් කළයුතු ශේෂ**

**-------------------------**

දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් මස 31 දිනට පිළියෙළ කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු මාස 06 කට වැඩි වර්ෂ 03 කට අඩු කාලයක සිට පැවත එන එකතුව රු.110,881 ක බැංකු තැන්පතු 2015 දෙසැම්බර් 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

**3.12 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) වාහන අසාධු ලේඛන ගතකිරීම

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 අගෝස්තු 06 දිනැති අංක DMT/H/E/6/01 දරන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර චක්‍රලේඛයේ 2 ඡේදය ප්‍රකාරව වාහන අසාධු ලේඛනගත කිරීම අභ්‍යන්තර විගණන අංශය පමණක් සිදුකළ යුතු වුවත්, වෙනත් අංශවල නිලධාරීන් විසින්ද අවස්ථා 12 කදී වාහන අසාධුගත ලේඛනයට ඇතුළත් කර තිබුණි.

(ii) වාහන අසාධු ලේඛනගත කිරීම් අවස්ථා 20 ක් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතියේ දත්ත නිවැරදි කර නොතිබුණි.

(iii) අවස්ථා 52 කදී වාහන අසාධු ලේඛනගත කිරීමට අදාළ තහවුරු ලිපි (විගණන සාක්ෂි) නොමැති බව විගණනයේදී අනාවරණය විය.

(ආ) විශේෂිත අරමුණු සඳහා පැරණි වෑන් රථ ශ්‍රී ලංකාවට ආනයනය කිරීමේදී රේගු සටහන්කරයේ සඳහන් නිෂ්පාදිත වර්ෂය වෙනුවට ඉදිරි වර්ෂයන් (නිෂ්පාදිත වර්ෂය වසරකින් හෝ දෙකකින් ඉදිරියට ගෙන ඒමෙන්) දැක්වීමෙන් මෝටර් රථ 14 ක් ලියාපදිංචි කර තිබුණි.

(ඇ) 2011 සැප්තැම්බර් 23 දිනැති රේගු සටහන්කරයක් මගින් ආනයනය කරන ලද යතුරු පැදි 47 ක් සම්බන්ධයෙන් නිෂ්පාදිත වර්ෂය 2011 වර්ෂය හෝ ඊට පෙර වර්ෂයක් විය යුතුව තිබුණත්, එම යතුරුපැදි ලියාපදිංචි කිරීමේදී නිෂ්පාදිත වර්ෂය ලෙස 2012 හා 2013 වර්ෂ වශයෙන් ඉදිරි වර්ෂයන් සඳහන් කර ලියාපදිංචි කර තිබුණි.

(ඈ) රේගු සංයෝජිත අංක 8705 යටතේ සියයට 7 ක අවම රේගු බද්දක් ගෙවා ආනයනය කර තිබුණු වසර 7 ක් දක්වා පැරණි විශේෂ කාර්යය වාහන 192 ක්, රේගු සංයෝජිත අංක 8704 යටතේ සියයට 85 සිට සියයට 115 අතර පරාසයක් තුළ රේගු බද්දක් ගෙවිය යුතු ද්විත්ව කාර්යය වෑන් රථ හා මෝටර් ලොරි ලෙස සඳහන් කර ලියාපදිංචි කර තිබුණි. මෙම තත්ත්වය රාජ්‍ය ආදායම අහිමිවීමට තුඩු දී තිබුණි.

**3.13 අවිධිමත් ගනුදෙනු**

---------------------

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) මෝටර් රථ ප්‍රවාහන පනතේ (203 වන අධිකාරිය) 42(I)(අ) වගන්තියට පටහැනිව ක්‍රියා කරමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ මෝටර් රථ ආනයනය කරනු ලබන ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කර නොතිබුණු ආයතන දෙකක් විසින් 2014 වර්ෂයේදී ආනයනය කර තිබුණු මෝටර් රථ 07ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කිරීමේදී එම ආයතනය නමින් ලියාපදිංචි නොකර වෙනත් පුද්ගලයකුගේ නමින් ලියාපදිංචි කර තිබුණි.

(ආ) යතුරු පැදි ලියාපදිංචි කිරීමට ඉදිරිපත් කරන ලියකියවිලි, දෙපාර්තමේන්තු පරිගණක ජාලයේ දත්ත සටහන් සමඟ සසඳා බැලීම සිදු නොකිරීම නිසා ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර යතුරු පැදි 214 ක් ලියාපදිංචි කර තිබුණි.

(ඇ) 2014 ජනවාරි 01 දිනට පෙර ආනයනය කරන ලද යතුරු පැදි ලියාපදිංචි කිරීමේදී අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද ලේඛන පමණක් පදනම් කරගෙන යතුරු පැදි ලියාපදිංචි කර තිබුණි. මේ නිසා ශ්‍රී ලංකා රේගුවේ පරිගණක පද්ධතියට ඇතුළත් කර නොතිබුණු රේගු සටහන්කර හා ඇසුරුම් ලේඛන අංකයන් යොදාගෙන යතුරු පැදි 227 ක් ලියාපදිංචි කර තිබුණි.

(ඈ) 2004 අගෝස්තු 16 දින මෙරටට ආනයනය කර තිබූ 2001 වර්ෂයේදී කොරියාවේ නිෂ්පාදිත හයිඋන්ඩායි (Hyundai) වර්ගයේ වාහනය, 2011 වර්ෂයේදී එක්සත් රාජධානියේ නිෂ්පාදිත

ලැන්ඩ්රෝවර් (Land rover Defender) වර්ගයේ වාහනයක් ලෙස වසර 11කට පසුව එනම් 2015 ජූලි 22 දින දෙපාර්තමේන්මේන්තුව විසින් ලියාපදිංචි කර තිබුණි.

**3.14 අධිකාරී බලය නොමැති වූ ගනුදෙනු**

---

මෝටර් රථ ප්‍රවාහන පනතේ 203 අධිකාරියෙහි XIII වන කොටසේ 240 වගන්තියට පටහැනිව 2015 අගෝස්තු 19 දිනැති අංක 5582 දරන රේගු සටහන්කරය යටතේ ආනයනය කර තිබූ ද්විත්ව කාර්ය වාහන ගණයට අයත් නොවන, වාහනයක් ද්විත්ව කාර්ය වාහනයක් ලෙස ලියාපදිංචි කර තිබුණි.

**3.15 විසදා නොතිබුණු විගණන ඡේද**

---

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2014 | 5.9(අ) (vii) (viii) | කාර්යසාධනය |
| 2014 | 5.10 (ඇ) (ඉ) (උ) (ඌ) (එ) (ඔ) | මතභේදයට තුඩුදෙන ගනුදෙනු |
| 2014 | 5.11 (iii) (iv) | මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු |
| 2014 | 5.13 (අ) | කළමනාකරණ දුර්වලතා |

**3.16 කළමනාකරණ දුර්වලතා**

---

මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ මුල් ලිපිගොනු නිසි පිළිවෙලට හා මනා තත්ත්වයෙන් සුරක්ෂිත භාරයේ තබා නොගැනීම නිසා ලිපිගොනු අස්ථානගතවී ඇති අවස්ථා නිරීක්ෂණය විය. එම නිසා මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ පරිගණක පද්ධතියේ අඩංගු දත්තවල නිවැරදි භාවය මුල් ලිපිගොනු මඟින් සනාථ කර ගැනීමට නොහැකි වී තිබුණි. මේ තුළින් මෝටර් රථ ලියාපදිංචි කිරීමේදී අක්‍රමිකතා ඇතිවීමේ පරිසරයක් නිර්මාණය වී තිබුණි.

## 3.17 මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 27 | 23 | 04 |
| තෘතියික මට්ටම | 21 | 05 | 16 |
| ද්විතීයික මට්ටම | 790 | 723 | 67 |
| ප්‍රාථමික මට්ටම | 133 | 129 | 04 |
| **එකතුව** | **971** | **880** | **91** |

ආයතන සංග්‍රහයේ 02 වන පරිච්ඡේදයේ 1,2 හා 3 වගන්තිවලට අනුගත නොවී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව 2012 වර්ෂයේ සංවර්ධන නිලධාරීන් 200 ක් බඳවා ගෙන තිබුණි. මෙම නිලධාරින් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීමේදී හම්බන්තොට හා අනුරාධපුර දිස්ත්‍රික්ක තුළ පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවා තිබුණද, බඳවා ගැනීමේදි හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් 75 ක්ද, අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් 08 ක්ද, කළුතර දිස්ත්‍රික්කයෙන් 91 ක් හා තවත් දිස්ත්‍රික්ක 11 කින් නිලධාරින් 26 දෙනෙකු ද වශයෙන් බඳවා ගෙන තිබුණි. මෙම පත්වීම් සඳහා අයදුම්පත් කැඳවීම, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා පත්කිරිම පත්වීම් බලධාරියා විසින් සිදුකර නොතිබුණු අතර අනුමත බඳවාගැනීමේ පටිපාටියක්ද 2015 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. ඉහත තත්ත්වය යටතේ බඳවාගෙන වසර හතරක් ගතවී තිබුණද, ආයතන සංග්‍රහයේ 2 පරිච්ඡේදයේ 11.1 වගන්තියට අනුව මෙම නිලධාරින් ස්ථිර කිරීමට නොහැකි වී තිබුණි.